හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# ගොවිකටයුතු

## පුවත් හසුන

වෙළුම 43 | 2019 සිව්වන කලාපය | ISSN 1991-040x

## මෙවර කලාපයෙන්,


- ගුණාත්මක අර්තාපල් දේශීය ව නිෂ්පාදනය කිරීමට නව ප්‍රවේශයක් පිටුව 2
- ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය පිටුව 3
- පොල් නිෂ්පාදනය කෙරෙහි ගෙවත්තේ විභවතාව පිටුව 4
- ශ්‍රී ලංකාවේ දේශීයව වැදගත් කෘෂිකාර්මික උරුමයන්: හඳුනා ගැනීම, උපයෝගීතාවය සහ සංරක්ෂණය පිටුව 5




## කෘෂි ව්‍යාපාර සංකල්ප හා අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ තෙදින වැඩමුළුව

කෘෂි ව්‍යාපාර සංකල්ප හා අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ තෙදින වැඩමුළුව අඛණ්ඩව සිව්වන වරටත් 2019 දෙසැම්බර් මස 13 දින සිට 15 දින දක්වා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි. මෙවර වැඩමුළුවේ ඉලක්ක කණ්ඩායම වූයේ යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂි ව්‍යාපාර හා ව්‍යාපාර ගිණුම්කරණය පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් ය.

තෙදින වැඩමුළුව අභ්‍යන්තර දේශන, දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ අන්තර්ක්‍රියාකාරී සැසි, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සහභාගිවන්නන්ගේ ඉදිරිපත් කිරීම්, ප්‍රායෝගික සැසි, සහ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ඇතුළු ක්‍රියාකාරකම් රැසකින් සමන්විත විය. මෙම වැඩමුළුව සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂකයින් මෙන් ම වෙනත් අදාළ පර්යේෂණ ආයතනයන් හි පර්යේෂකයින් හා විද්වතුන්, පෞද්ගලික අංශයේ කෘෂි ව්‍යාපාර යෝජකයින්, වෘත්තිකයින්, ව්‍යවසායකයින් සහ කළමනාකරුවන් රැසක් ඔවුන්ගේ විශේෂඥ දැනුම හා අත්දැකීම් ලබා දීම පිණිස සම්පත් දායකයින් ලෙස සම්බන්ධ විය.

පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ශාන්ත හේවගේ මහතා වැඩමුළුව සම්බන්ධීකරණය කළ අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සිදත් බණ්ඩාර මහතා සම-සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේ ය.

ඡායාරූප 08 පිටුවේ...

# ගුණාත්මක බීජ අර්තාපල් දේශීය ව නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයේ දිශානතිය



ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක බීජ අර්තාපල් අවම පිරිවැයකින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයට බලපාන කරුණු කාරණා පිළිබඳ සොයා බැලීමේ අරමුණින් පර්යේෂණ අධ්‍යනයක් අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය විසින් දියත් කර තිබේ.

අධ්‍යනයේ අරමුණු වන්නේ,

1. දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බීජ අර්තාපල් නිෂ්පාදන ක්‍රියාවලියේ සහ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයේ ව්‍යුහය-හැසිරීම-කාර්ය සාධනය පිළිබඳව අධ්‍යයනය කිරීම

2. ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක භාවයෙන් ඉහළ බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා ඵලදායි රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාර ගොඩනැඟීම සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශන යෝජනාවලියක් සකස් කිරීමයි.

එම අංශයේ පර්යේෂණ නිලධාරී අයි.වී.කුරුප්පු මහතා මෙම අධ්‍යයනයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන අතර සම පර්යේෂකවරු ලෙස එස්.පී. ප්‍රනාන්දු සහ ඒ.ආර්.ඩබ්.එම්.එම්.ඩී. අමරකෝන් යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

සිය නිර්දේශ ඉදිරිපත් කරමින් පර්යේෂණ කණ්ඩායමේ සම්බන්ධීකරණ පර්යේෂණ නිලධාරී අයි.වී. කුරුප්පු මහතා පෙන්වා දෙන්නේ, රට තුළ ගුණාත්මක බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ඇති කිරීම මෙම ගැටලුව මඟහරවා ගැනීම සඳහා එක් ප්‍රවේශයක් බවයි. ගොඩනැඟීම - ක්‍රියාත්මක කිරීම - මාරු කිරීම (build-operate-transfer) ඒ සඳහා සුදුසුම ආකෘතිය ලෙස ද ඔහු පෙන්වා දෙයි.

එම ප්‍රවේශයේ දී රාජ්‍ය අංශයේ ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයක් ලබා ගැනීම සිදුකරනු ලබයි. එහිදි, පුද්ගලික ආයතනයකට පොදු පහසුකමක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ පාර්ශවයෙන් නිශ්චිත කාලයක් සඳහා සහනයක් ලැබේ.

සංවර්ධනය සමන්විත වන්නේ,

I. පහසුකම් සැපයීම
II. සැලසුම් කිරීම සහ ඉදිකිරීම
III. පහසුකම් කළමනාකරණය
IV. නඩත්තු කිරීම

පහසුකම ක්‍රියාත්මක කිරීමෙන් සහ සහන කාලය තුළ හිමිකරු ලෙස පුද්ගලික ආයතනයට ආයෝජනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වේ. සහන කාලපරිච්ඡේදය අවසානයේ දී, පුද්ගලික ආයතනය විසින් කිසිදු කොන්දේසියකින් තොරව බලපත්‍රයේ හිමිකාරිත්වය රාජ්‍ය ආයතනයට පැවරේ.

එසේ වුවද, කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා නිසි ප්‍රතිපත්තිමය මුලපිරීමක් ශ්‍රී ලංකාව සතුව නොපවතී. සියලුම හවුල්කාරිත්වයන් අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ සහ අවදානම් බෙදා ගනු ලබයි. කෙසේ වෙතත් මෙය නිසි නීතිමය ගිවිසුමක් මඟින් සකස් කළ යුතු කරුණකි. නිසි ප්‍රතිපත්තියකින් තොරව හවුල්කරුවන් පවා මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ නො කරයි. එබැවින්, කෘෂිකාර්මික යෙදවුම් හා සම්බන්ධ ව ශ්‍රී ලංකාව යථාර්ථවාදී හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමටත් නිසි නීතිමය වාතාවරණයක් සකස් කිරීම සඳහාත් කඩිනමින් පියවර ගත යුතු බව අධ්‍යයනය මඟින් වැඩි දුරටත් පෙන්වා දෙයි.

# ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය



> " කිරි නිෂ්පාදනයේ අගය දාමයන් නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා විශ්ලේෂණය කිරීමේ අරමුණින් මේ අධ්‍යයනය සිදුකර තිබේ. "

කිරි නිෂ්පාදනයේ අගය දාමයන් නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා විශ්ලේෂණය කිරීමේ අරමුණින් කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීමේ අංශය මඟින් පර්යේෂණ අධ්‍යයනයක් ක්‍රියාත්මක කරනු ලැබිණි.

අධ්‍යයනයේ අරමුණු වන්නේ,

1. කිරි නිෂ්පාදනයට අදාළ නීති හා විධි විධාන මොනවා ද? යන්න හඳුනා ගැනීම.
2. කිරි නිෂ්පාදනයට අදාළ විවිධ ස්ථරවල පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම හා ඒවායේ ගැටලු හඳුනා ගැනීම.
3. කිරි නිෂ්පාදනයට අදාළ අගය දාමයන් සිතියම් ගත කිරීම.
4. කිරි නිෂ්පාදනයට අදාළ විවිධ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම.
5. කිරි නිෂ්පාදනයේ විවිධ නිෂ්පාදන පද්ධතීන් ආශ්‍රිතව ඇති හිඩැස හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකාවේ සියලුම කිරි නිෂ්පාදන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක හයක කිරි ගොවීන් 180දෙනෙකු හා කිරි නිෂ්පාදකයින් 53දෙනෙකු සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මී කිරි නිෂ්පාදකයින් හය දෙනෙකු මෙම අධ්‍යයනය සඳහා සම්බන්ධ කර ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදකයින්ගෙන් බහුතරය සුළු පරිමාණ නිෂ්පාදකයෝ වෙති. ඒ අතරින් කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදනවලට යොමු වී ඇති පිරිස ඉතා අඩු ය.

කිරි ලීටරයක් නිපදවීම සඳහා පවුලේ ශ්‍රමයට අගය එකතු කර රු.59.63ක් වැය වී ඇතැයි අධ්‍යයනයෙන් අනාවරණ කර ගෙන ඇති අතර එයින් 53%ක් ශ්‍රමය සඳහා ද 42%ක් ආහාර සඳහා ද වැය වේ. සතුන්ට සාන්ද්‍ර ආහාර ලබා දීමේ දී සත්ත්ව ආහාරවල මිල ඉහළ යෑම විශාල ගැටලුවක් බව අනාවරණය විය. ගොවීන්ගෙන් 52%ක් පමණ සතුන්ට ජලය සැපයීමේ දී ගැටලු ඇති බව ද, ඒ තුළින් හෙළි කර තිබේ.

කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදනවල දී මී කිරි නිපදවීම ඉතා බහුලව සිදු වන අතර යෝගට් නිපදවන්නන් හට ඒවා අලෙවි කිරීමේ ගැටලු ඇති බව අනාවරණය විය. මෙයට අමතරව අයිස් ක්‍රීම් නිපදවීම වඩා වාසිදායක බව ද අනාවරණය වී තිබේ.

කිරි ගව පාලනයට තරුණ පරපුර එකතු වීමේ අඩු නැඹුරුතාවයක් දක්නට ලැබෙන්නේ තවමත් මෙම කර්මාන්තය සාම්ප්‍රදායික ක්‍රම අනුගමනය කරන නිසා ය. එබැවින්, නව තාක්ෂණය උපයෝගී කර ගෙන අතුරු නිෂ්පාදනයටත්, කිරි නිෂ්පාදනයටත් යොමු වීම තුළ පවුලේ ආදායම ඉහළ නංවා ගත හැකි ය යන්න පර්යේෂණ කණ්ඩායම විසින් නිර්දේශ කරයි. කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීමේ අංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී සාගරිකා හිටිහාමු මහත්මිය මෙම අධ්‍යයනයේ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනියන් වන සුසිලා ලූර්දු සහ දිලූපා බමුණුආරච්චි යන මහත්මීහු සම පර්යේෂකවරු ලෙස කටයුතු කරති.



# පොල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කෙරෙහි ගෙවත්තේ විභවතාව

**"පවතින පොල් නිෂ්පාදනය ගෘහස්ථ පරිභෝජනය සහ කර්මාන්ත සඳහා ප්‍රමාණවත් නොවේ"**

පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි ගෙවත්තේ විභවතාවය සොයා බැලීම අරමුණු කර ගනිමින් මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ පර්යේෂණ අංශය විසින් මෙම පර්යේෂණ අධ්‍යයනය දියත් කර තිබේ.

ගෘහස්ත පොල් ගෙඩි නිෂ්පාදනය ගෙවතු මට්ටමින් ඉහළ නැංවීම හා වගාවට බලපා ඇති ගැටලු හඳුනා ගැනීම මඟින් ජාතික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක වීම කාලීන අවශ්‍යතාවයකි.

අධ්‍යයනයේ අරමුණු වන්නේ,

1. ගෙවතු තුළ පොල් නිෂ්පාදනයේ දී මුහුණ දෙන දුෂ්කරතා සහ අනෙකුත් සාධක හඳුනා ගැනීම
2. දැනට ගෙවතු තුළ පොල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම හා ගෙවතු තුළ පොල් නිෂ්පාදනයේ විභවතාවය සොයා බැලීම
3. මාසික ගෘහස්ථ පොල් පරිභෝජනය ගණනය කිරීම
4. ගෙවතු තුළ පොල් නිෂ්පාදනයට බලපාන ගැටලු හා දුෂ්කරතා අඩුකර ගැනීමේ ක්‍රම සොයා බැලීම මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රම යෝජනා කිරීම

ශ්‍රී ලංකාවේ පොල් වගාව අක්කර මිලියන 1.1ක් පුරා පැතිරී තිබේ. පොල් සංවර්ධන මණ්ඩලයේ දත්තවලට අනුව ඉන් අක්කර 0.9ක් කුඩා වතු යටතට අයත් ය. 2017 වර්ෂයේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2450 පමණ විය.

කෙසේ වුව ද, පවතින ජාතික පොල් නිෂ්පාදනය ගෘහස්ථ පරිභෝජනය සහ කර්මාන්ත සඳහා ප්‍රමාණවත් නොවේ.

ප්‍රතිපත්ති සම්පාදකයින් , ගෙවතු හිමියන්, පාරිභෝගික ජනතාව, පොල් වතු හිමියන් සහ පොල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනවල නියැළෙන්නන් මෙහි ඉලක්කගත පිරිස ලෙස සඳහන් කළ හැකිය. ගම්පහ, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක තුළ මෙම අධ්‍යයනය සිදු කිරීමට අපේක්ෂිතය.

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ පර්යේෂණ නිලධාරිනි නොරිකා අයෝමි මහත්මිය විසින් පර්යේෂණය මෙහෙයවන අතර සම පර්යේෂකයින් ලෙස අධි පර්යේෂක එස්.එම්.ඒ සමරකෝන්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී පී.සී.ජේ ද සිල්වා, පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රනාන්දු සහ පර්යේෂණ නිලධාරී විරාජිත් කුරුප්පු යන මහත්වරු කටයුතු කරති.

# ශ්‍රී ලංකාවේ දේශීයව වැදගත් කෘෂිකාර්මික උරුමයන් : හඳුනා ගැනීම, උපයෝගීතාවය සහ සංරක්ෂණය



ශ්‍රී ලංකාව වසර 2500කට වඩා ඈත කෘෂිකාර්මික ඉතිහාසයක් ඇති රටකි. අතීතයේ සිට වර්ධනය සහ විකසනය වෙමින් පරම්පරාවෙන් පරාවට පැමිණ වර්තමානය දක්වා උරුම වී ඇති දේශීය කෘෂිකාර්මික දැනුම් සම්භාරය වූ කලී විශාල විවිධත්වයකින් යුතු වූත්, ශ්‍රී ලංකාවට අනන්‍ය වූත්, මනා නිපුණතාවකින් යුතු වූවකි.

දේශීය වශයෙන් විකාශනය වී තිබෙන මෙම ගොවිතැන් සහ ගොවිපොළ කළමනාකරණ ක්‍රමවේදයන් සහ පද්ධතීන් ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසරය හා දේශීය දේශගුණය සමඟ හොඳින් අනුගත වී ඇත.

දේශීය, විචක්ෂණ දැනුම විශාල ප්‍රමාණයක් අන්තර්ගතව ඇති මෙම තිරසාර පද්ධති, ශ්‍රී ලංකාවේ දේශීයව වැදගත් කෘෂිකාර්මික උරුමයන් ලෙස සැලකිය හැකිය. කෙසේ වුවත්, වාණිජ කෘෂිකර්මාන්තයේ ශීඝ්‍ර විකසනයත් සමඟ මෙම කෘෂිකාර්මික පද්ධතීන් ගේ විද්‍යාත්මක පදනම සහ එම දැනුම වත්මන් කෘෂිකර්මාන්තයේ ස්ථිරසාර බව ඉහළ නංවා ගැනීමට යොදා ගැනීමේ හැකියාව හඳුනා ගැනීමටත් පෙරම නැති වී යාමේ අවධානමට පත් ව ඇත.

මෙවන් තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවේ මෙම පද්ධති නිර්වචනය කිරීමට, හඳුනා ගැනීමට, එකතු කිරීමට හා සංරක්ෂණය කිරීමට ජාතික ප්‍රතිපත්තියක් හා යාන්ත්‍රණයක් නොමැත.

මෙම ගැටලුවේ කාලෝචිත වැදගත්කම හඳුනා ගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ තිරසාරභාවය කෙරෙහි කෘෂිකාර්මික උරුම පද්ධතිවල බලපෑම අධ්‍යයනය කරන ලෙස අප ආයතනයෙන් කළ ඉල්ලීමක් සලකා බලමින් ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික පද්ධති, ඒවායේ අදාළතාවය සහ සංරක්ෂණය හඳුනා ගැනීම පිණිස මෙම අධ්‍යයනය සිදු කිරීමට අපේක්ෂා කරයි.

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමයන් හඳුනා ගැනීම, නූතන කෘෂිකාර්මික උරුමයන් හඳුනා ගැනීම, නූතන කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා ඒවා යොදා ගැනීමේ හැකියාව හඳුනා ගැනීම සහ ඒවා සංරක්ෂණය කිරීමේ ක්‍රමවේදයන් යෝජනා කිරීමයි.

අධ්‍යයනයේ විශේෂිත අරමුණු වන්නේ,

1. ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති හඳුනා ගැනීම සඳහා සුදුසු තෝරා ගැනීමේ නිර්ණායකයක් භාවිතා කරමින් වර්ගීකරණ පද්ධතියක් ගොඩ නැගීම.

2. ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති හඳුනා ගැනීම, එකතු කිරීම සහ ගබඩා කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.

3. නවීන කෘෂිකාර්මික පද්ධතිවල ඵලදායිතාව, ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර බව වැඩි දියුණු කිරීම සඳහා ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතිවල යෝග්‍යතාවය හඳුනා ගැනීම.

4. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම ලබා දීම.

පාරිසරික සහ ජලසම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරිනි උත්පලා ජයසිංහ මෙනෙවියගේ අධීක්ෂකත්වයෙන් සිදු කරන අධ්‍යයනයේ සහය පර්යේෂක කණ්ඩායම ලෙස පර්යේෂණ නිලධාරීනි මාලතී රම්බොඩගෙදර සහ පර්යේෂණ නිලධාරිනී රසිකා විජේසිංහ යන මහත්මීහු කටයුතු කරති.

පුහුණු පුවත්

# සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන





පොළොන්නරුව දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සංවර්ධන නිලධාරීන් සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් සඳහා සංවිධානය කළ සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් 2019 නොවැම්බර් මස 26 දින සිට 29 වන දින දක්වා පොළොන්නරුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මෙම වැඩමුළුවේ අරමුණ කෘෂිකර්මික ක්ෂේත්‍රය තුළ ව්‍යාප්තිකරුවන් ලෙස කටයුතු කරන ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සඳහා සමාජ සජීවීකරණය හා ව්‍යාප්ති ක්‍රමවේදයේ මූලික සංකල්ප හා ක්‍රම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමයි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සංවර්ධන නිලධාරීන් සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් 100 දෙනෙකු සඳහා දින දෙකක පුහුණු වැඩසටහනක් ලෙස මෙය පැවැත්විණි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන/අධි පර්යේෂක එස්.එම්.ඒ. සමරකෝන් මහතා මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරි ලෙස කටයුතු කළේය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා, පර්යේෂණ නිලධාරීන් වන සංගීත් ප්‍රසාද්, විරාජිත් කුරුප්පු යන මහත්වරු ද සම්පත් දායකත්වය ලබා දුන්හ.

බාහිර සම්පත් දායකයින් ලෙස හිටපු අතිරේක අධ්‍යක්ෂ ආර්.එල්.එන්. ජයතිස්ස මහතා, අනුරාධපුර දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කාර්යාලයේ විශ්‍රාම ස්ථානභාර ගොවිජන සංවර්ධන නිලධාරී බී.ඩී.එච්.ආර්.බී. දිසානායක මහතා, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සංවර්ධන කොමසාරිස් එච්.එම් කුලතුංග මහතා දේශන පැවැත්වූහ.

සහය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබුවේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ කළමනාකරණ සහකාර එච්.එල්.එල්. සාලින්ද මහතා ය.

# ඡායාරූපකරණය පිළිබඳ එක් දින ප්‍රායෝගික වැඩමුළුව

දිවයින පුරා ක්ෂේත්‍ර මට්ටමින් පර්යේෂණයන්ට අදාළ ක්‍රියාකාරකම්හි නිරත වන මෙම ආයතනයේ පර්යේෂණ කාර්යමණ්ඩලයට හා උනන්දුවක් දක්වන්නන්ට තම පර්යේෂණ ක්‍රියාකාරකම්වලට අදාළ ඡායාරූප කිසියම් ශිල්පීය දැනුමකින් යුතුව ලබා ගැනීමට පුහුණුවක් ලබා දීමේ අරමුණින් ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුවක් ප්‍රකාශන ඒකකය විසින් සංවිධානය කරනු ලැබිණි.



ඉන්ද්‍රනාථ තේනුවර මහතා දේශනය පවත්වමින්

ක්ෂේත්‍ර ඡායාරූප වඩාත් වටිනා සහ තොරතුරුමය වැදගත්කමකින් යුතුව ලබා ගැනීමට පුහුණු කිරීම එහි අරමුණයි. ආයතනයේ පර්යේෂණ නිලධාරීන්, සංඛ්‍යාන නිලධාරීන්, සංඛ්‍යාන සහකාරවරුන් සහ අනියම් විමර්ශකයින්ට ඡායාරූපකරණය පිළිබඳ න්‍යායාත්මක දැනුමක් හා පුහුණුවක් මෙහිදී සපයන ලදී. ප්‍රවීණ ඡායාරූප ශිල්පී, දේශක ඉන්ද්‍රනාථ තේනුවර මහතා විසින් වැඩමුළුව මෙහෙය වූ අතර  වැඩමුළුව 2019 දෙසැම්බර් මස 16 දින නව ශාලාවේ දී පැවැත්විණි.



දේශනයට සහභාගීවූවන්

පර්යේෂණ කටයුතුවල නිරතවන ආයතනික පර්යේෂණ නිලධාරීන්, පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ කටයුතු සඳහා ක්ෂේත්‍රයට යන  සංඛ්‍යාන නිලධාරීන්ට, අනියම් විමර්ශකයින්ට ඡායාරූපකරණය පිළිබඳ විධිමත් අත්දැකීම් හෝ වෘත්තීමය නිපුණතාවයක් නොමැති හෙයින් පර්යේෂණ ප්‍රකාශන සඳහා දෘශ්‍ය මාධ්‍ය භාවිතා කිරීමේ දී ගැටලු මතු වේ. ඒ සම්බන්ධ නිසි පුහුණුවක් ඔවුන් වෙත ලබා දීමෙන් ප්‍රකාශන සඳහා ගුණාත්මක මට්ටමේ ඡායාරූප ලබා ගැනීමේ හැකියාවක් පවතී. එම අරමුණු පෙරදැරිව මෙම වැඩමුළුව සංවිධානය කෙරිණි.



සහභාගීවූවන්ගේ සමූහ ඡායාරූපය



පර්යේෂණ ප්‍රජාවගේ සහභාගීත්වය

# ගොවිකටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ. ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.


### උපදේශකත්වය

දුමින්ද ප්‍රියදර්ශන
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)

### අධීක්ෂණය

එස්.ඒ.සී.යූ සේනානායක
ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

### සම්පාදනය

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

### නිර්මාණකරණය

උදේනි කරුණාරත්න
පරිගණක අකුරු සැකසුම්කරු

### ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



දුරකථනය- 0112 696981
ෆැක්ස් - 0112 692423
වෙබ් www.harti.gov.lk
ෆේස්බුක් https://www.facebook.com/hartilk/


## කෘෂි ව්‍යාපාර සංකල්ප හා අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ තෙදින වැඩමුළුව


පළමු පිටුවෙන්




වැඩසටහනට සහභාගී වූ පිරිස ඡායාරූපයකට පෙනී සිටිමින්



ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ශාන්ත හේවගේ මහතා කරුණු පැහැදිලි කරමින්



දේශනයක් අතරතුර




වැඩසටහනට සහභාගී වූ සිසු පිරිස ක්ෂේත්‍රය තුළ දී සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින්



සැසිය අතරතුර දී...